## නැවත නගා සිටුවන වෙල්ලස්සේ

# පැණි දොඩම් වගාව



දෙහි කුලයට අයත් පළතුරු සලකා බලන කළ ඒවා මෙරට සුළු බෝගයන් අතරට වැටේ. මෙරට මෙම බෝගය ප්‍රධාන වශයෙන් පාරම්පරිකව වගා කරන්නේ මොණරාගල දිස්ත්‍රික්කයේ ය. පසුගිය අවුරුදු 25 ක කාලයක් තිස්සේ ට්‍රිස්ටෙසා වෛරස රෝගය නිසාත්, 1973 නියඟය නිසාත් වගාවන් පරිහානියට ගොස් තිබේ. කෙසේ වුව ද, මෙම වගාව නැවත නගා සිටුවීමට දැන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් විශේෂ වැඩ පිළිවෙළක් යොද ඇත.

දෙහි කුලයට අයත් දොඩම්, දෙහි, ජමනාරන් සහ ජම්බෝල යනාදිය ලංකාවේ හැම තැනකම පාහේ වවනු දක්නා ලැබේ. නිවෙස් අසල වැවෙන ගහක් දෙකක් සිට අක්කර 1/2 සිට 8 දක්වා වන වතු ද, වාර්තා වී ඇත. මෙරට ඇති මුළු දෙහි දොඩම් වගා අක්කර ගණන සාමාන්‍යයෙන් 10,000 ක් පමණ වේ යැයි ඇස්තමේන්තු කර තිබේ.

මෙරට අඩු තරමින් පළාත් දෙකකවත් මෙම වගාවන් ප්‍රධාන වශයෙන් සංකේන්ද්‍රිය වී තිබේ. මෙයින් විශේෂයෙන් බිබිලේ-මොණරාගල ප්‍රදේශය වඩාත් වැදගත් වේ. මෙම ප්‍රදේශයේ සාමාන්‍ය වර්ෂා පතනය සතුටුදායක යයි කිව හැකි අතර, වියළි කාලය කෙටි ය. සාමාන්‍යයෙන් මෙම කුලයේ ගස්වලට ජලය හිඟවීමේ පීඩාවලට ඔරොත්තු දිය හැකියා දැනට මෙම පළාතේ දෙහි දොඩම් වගාවලට වාරිමාර්ගය ජලය සැපයීමක් සිදු කරන්නේ නැත. මෙම සංකේන්ද්‍රියවීමෙන් උතුරට හා බටහිරට වන්නට විශේෂයෙන් ලග්ගල හා ගල්ඔය නිම්නයේ උතුරට වන්නට තවත් දෙහි දොඩම් වගාවන කුඩා ප්‍රදේශයක් පවතී.

අනෙක් ප්‍රධාන ප්‍රදේශය දිවයිනේ උතුරෙහි වන ඔමන්තායි ප්‍රදේශයට යාබදව පවතී. මෙහි වියළි ඍතුව සාමාන්‍යයෙන් මාස 7 කට වඩා පවතින අතර, බොහෝ විට වගාවන්ට වාරිමාර්ග ජලය සපයනු ලබයි.

දැනට මෙම වගාවන් කෙරෙන ප්‍රදේශවල පස රතු දුඹුරු පසට අයත් වේ. පලතුරු පැල කරනු ලබන්නේ බීජ වලින් වන අතර, බද්ධ කරණය බොහෝ දුරට පර්යේෂණ මධ්‍යස්ථානවලට සීමා වී පවතී.

වරක් මෙරට දෙහි දෙඩම් වගාව සම්බන්ධව සමීක්ෂණයක් කළ ඊශ්‍රායල් විශේෂඥයින් පිරිසක් කළ වාර්තාවට අනුව රතු දුඹුරු පසෙහි මෙම වගාවන් කිරීම පිළිබඳව අඩුපාඩුකම් රැසක් වාර්තා කර ගතිබේ. මෙම පසේ හොඳින් දිය බැස යන බවකින් යුතුවන අතර, ප්‍රමාණවත් පෝෂ්‍ය පදර්ථද අඩංගු වන්නේ වුව ද, අවශ්‍ය තරමට ගැඹුරට නොපිහිටීම නිසා වගාවන් කලක් යාමේ දී නිසරු වන බව පෙන්වා දී ඇත. දෙහි දෙඩම් කුලයේ වගාවන් උදෙසා පස අඩු තරමින් අඩි 6 ක් වත් ගැඹුරට පිහිටිය යුතු වේ.

අනෙක් කරුණ පවතින වගාවන් සම්බන්ධව වුවද වගා පිළිවෙත් ඉතා ප්‍රාථමික මුහුණුවරක් ගන්නා බව ඔවුන් පෙන්වා දී ඇත. පස සංරක්ෂණය කිරීමට පියවර ගෙන නොතිබීම නිසා ද දෙඩම් ගස්වල මුල් පසට අඩියක් පමණ ඉහලින් වන තෙක් පිහිටුවන තරමට සෝද පාළුවීම්වලට භාජනය වී තිබෙන බව ඔවුන් වාර්තා කර ඇත. මේ තත්වය නිසා අවුරුදු 5–15 දක්වා හොඳින් වැවෙන ගස් ඉන් පසු බෙහෙවින් දුර්වල වී යන බව පෙන්වා දී තිබේ.

අනෙක් අතින් ලියන්ගොල්ල-සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පිහිටි ලෝම පසෙහි වැවෙන ඉතා පැරණි ගස් වුව ද, තවමත් සශ්‍රීකව පවතී. ඊට හේතුව මේ පස් සෑහෙන ගැඹුරට පිහිටීම නිසාත්, ප්‍රමාණවත් ජලය බැස යාමකින් යුතුවන නිසාත් වගාවන්ට යහපත්වන තක්ත්වයකින් හෙබි බැවිනි.

ශ්‍රී ලංකාවේ විශේෂයෙන් බදුළු ප්‍රදේශයේ දෙහි දෙඩම් කුලයේ පළතුරු වගාවල පරිහානියට වඩාත් ම හේතු වූයේ පසෙහි සහ ජලය සැපයීම සම්බන්ධව තත්වයන්හි නොසුදුසු බවත් මෙන්ම පෝර යෙදීම සහ රෝග මර්ධනය පිළිබඳ වගා පිළිවෙත්වල අඩුපාඩුකමුත්‍ය. ඊශ්‍රායල් විශේෂඥයින් විසින් සඳහන් කළ තොරතුරුවලට අනුව මෙම වගාවන් පරිහානියට හේතු වූ මූලික කාරනය ඉහත සඳහන් කරුණු මිස ට්‍රිස්ටෙසා වෛරස රෝගයට නොවේ.

ට්‍රිස්ටෙසා වයිරස වසංගතය 1930 ට පෙර විශාල පරිමාණයෙන් මෙරට දක්නට තිබුණි. එම රෝගය විශේෂයෙන් පැතිර ගියේ එම කාල වකවානුවේ දී දකුණු අප්‍රිකාවේත් සහ ඕස්ට්‍රේලියාවේත් බද්ධ කල පැළෑටි මෙරටට ආනයනය කිරීමත් සමඟ ය. දැනට මෙම වයිරසයට එරෙහිව ප්‍රතිකර්ම කිසිවක් ලෝකයේ සොයා ගෙන නොමැත. ඒ නිසා වගාවන් එම රෝගයෙන් සම්පූර්ණ යෙන් මුදවා ගැනීම අපේක්ෂා කළ නොහැකි දෙයකි. තත්වය මෙසේ තිබුණත් මෙරට සතුටුදයක දෙහි දෙඩම් පලතුරු වගාවක් ඇති කිරීම උදෙසා මඟ පාද ගත යුතුව පවතී. ඊට මෙම වෛරසයට ඔරොත්තු දෙන වර්ග හොඳ වගා පිළිවෙත් ඒ සඳහා හොඳම මාර්ගය වී තිබේ.

මෙරට තත්වයන් යටතේ බිබිලේ පැණි දෙඩම් හෝ ඔමන්තායි වැනි වර්ග පිටරටින් ගෙනවුත් වගා කරන ඒවාට වඩා හොඳ පළතුරු ගෙඩි ලබා දෙන බව හෙළිදරව් වී තිබේ. කෙසේ වුව ද, මේ තත්වය අවසාන නිගමනයක් ලෙස පිළිගත නොහැකි වනුයේ හොඳ වගා තත්වයන් යටතේ පිටරටින් ගෙන්වා පැළෑටි ද්‍රව්‍ය වගා නොකළ නිසා ද විය හැකි බැවිනි. එම නිසා එම වර්ග ද බීජවලින් මෙන් ම බද්ධ කළ පැළෑටි වශයෙන් ද ප්‍රශස්ථ වගා තත්වයන් යටතේ ගැඹුරු පසක් ඇති ස්ථාන වල ප්‍රමාණවත් අන්දමින් පෝර සහ වාරිමාර්ග ජලය යොද වගා කර බැලිය යුතු වේ. මෙයට විශේෂ යෙන් 'වොෂින්ටන් නේවල්' සහ 'වැලෙන්සියා' වර්ග සම්බන්ධව සොයා බැලීම වැදගත් වේ. තවද, අත්හද බැලීම් උදෙසා නිර්දේශ කෙරෙන අනෙකුත් දෙඩම් වර්ග නම් ඊශ්‍රායලයේ 'ශ්‍රීටවා' ෆ්ලොරිඩාවේ 'පාසන් බ්‍රවුන්' සහ 'හොමොසොස්ආ' බ්‍රසීලයේ 'කොසිර්වරා' සහ 'බයහින් හා දකුණු ඉන්දියාවේ 'සත් ගුඩි' සහ 'මොසැම්බික්' වර්ගයන්ය.

අප ධෛර්යමත් වන්නේ නම් දෙඩම් වගාව නඟා සිටුවීමට ඕනෑ තරම් ඉඩ ඇති බවට බ්‍රසීලයෙන් ආදර්ශයක් ලබා ගත හැකිය. එරට දෙඩම් ගස් දශ ලක්ෂ 7 ක් පමණ ට්‍රිස්ටෙසා වයිරස් රෝගය විනාශ කළ නමුදු එරට දෙඩම් වගාව නැවත නඟා සිටවන ලදුව, දැන් ලෝක වෙළඳ පොළට විශාල දෙඩම් ප්‍රමාණයක් එරට මඟින් එවනු ලබයි.

මෙරට සාර්ථක දෙඩම් වගාවක් ඇති කිරීම උදෙසා එම විශේෂඥයින් විසින් කල නිර්දේශයන් සමහරක් මෙසේ ය.

1. දෙහි දෙඩම් කුලයේ වගාවන් කළ යුත්තේ සුදුසු පස් වර්ග පිහිටි ප්‍රදේශ වල පමණි. මෙය මනා ලෙස කරන ලද පස් සමීක්ෂණයකින් පසුව කළ යුත්තකි. පස අඩු තරමින් අඩි 5 ක් වත් ගැඹුරු විය යුතු අතර, එම පස් තට්ටුවට යටින් බොරළු සහිත බවක් නොවිය යුතු ය. තෙත්කාලයේ දී භූගත ජල මට්ටම මතු පිටට සිට අඩි 3 කට වඩා ගැඹුරට තිබිය යුතුයි.

2. මෙම වගාවන්ට උචිත පස් දක්නට ඇත්තේ වියළි කලාපයේය. විශේෂයෙන් පුත්තලම, මන්නාරම් ප්‍රදේශය, මූලතිව් ප්‍රදේශය අනෙකුත් අර්ධ වියළි ප්‍රදේශවල විශේෂයෙන් බිබිලේ, මොණරාගල, ලියනගොල්ල, ලග්ගල, ගල්ඔය, සහ අනෙකුත් ප්‍රදේශයන් ය. මෙම ප්‍රදේශයන් තුළ වුව ද, මෙම වගා කිරීමට සුදුසු පස් ඇති ස්ථාන පිහිටා ඇත්තේ ප්‍රදේශ ගතව සීමිත වශයෙනි.

3. වියළි කලාපයේ දෙහි දෙඩම් පළතුරු වතු ඇති කරන්නන් හට තම වගාවන්ට වාරිමාර්ග ජලය සැපයීම අවශ්‍ය වනු ඇත. ස්ප්‍රින්ක්ලර් ක්‍රමයේ වාරිමාර්ග ජලය විසුරුවා ලන උපකරණ ඒ සඳහා උපයෝගී කර ගත හැකි වගා ක්‍රමයකි.

4. ගස් නීරෝගීවත්ව තබා ගැනීමත් හොඳ පලදාවක් ලබා ගැනීමටත් පෝර යෙදීම අත්‍යවශ්‍ය කරුණක්ව පවතී.

5. මිශ්‍ර බෝගවලින් යුතු පලතුරු වර්ග වගා කිරීම නොකලයුතුය. දෙඩම් දෙහි කුලයේ ගස් තනි වගාවක් හැටියට ම කළයුතු අතර ආවරණය උදෙසා ගස් නොතිබිය යුතුය.

6. වාරිමාර්ග ජලය නොසැපයෙන ප්‍රදේශයන්හි බීජ වලින් ලබා ගන්නා පැල පමණක් වගා කළ යුතු ය. අතිරේක ජලය අවශ්‍ය වන ප්‍රමාණයට වාරිමාර්ග ක්‍රමයකින් සැලැස්විය හැකි ප්‍රදේශවල බද්ධ කළ පැලෑටි වගා කළ හැකි ය.

7. බීජ ලබා ගත යුත්තේ දනට හොඳින් වගා වෙන වර්ගයක නිරෝගීමත් ගස් වලින් ලබා ගන්නා ඇට වර්ග වලින් පමණි.

8. සෑම ගස් වදුලකම රෝග සහ කෘමි උවදුරු මර්ධනය කිරීමට කටයුතු කළ යුතුය.

7. දෙහි දෙඩම් කුලයේ පළතුරු උදෙසා පුළුල් පර්යේෂණ වැඩ සටහනක් සංවිධානය කළයුතු ය. මෙයට පස් වාරිමාර්ග ජලය සැපයීම, පෝෂණය, මවු ගස් නැතිනම් "රූට් ස්ටෝක්" වර්ග (නිවර්තනික තත්වයන් යටතේ ඉහළ ම තත්වයේ පලතුරු වැඩි වශයෙන් ලබා දෙන වර්ග ය) පැලෑටි රෝග (ශ්‍රී ලංකාවේ පවතින ඒ සඳහා දෙහි දෙඩම් කුලයේ ගස්වල රෝග තත්වයන් පිළිබඳ තතු සොයා බැලීමටත්) බිබිලෙ පැණි දෙඩම් හා වර්ගවල පවතින ට්‍රිස්ටෙසා වයිරසයට ඔරොත්තු දෙන ශක්තිය ගැන සොයා බැලීමත් ය.

10. සුදුසු පරිදි පුහුණුවක් ලැබූ ව්‍යාප්ති සේවකයින් මගින් දෙහි දෙඩම් පලතුරු වගා කරන්නන්ට නවීන වගා පිළිවෙත් ගැන දැනීමක් ලබා දීම කල යුතුය.

11. මෙම පලතුරු වගා කරන ප්‍රදේශවල අලෙවිය උදෙසා ගම් මට්ටමේ සංවිධාන පිහිටුවා ඒවා මගින් පෝර, රෝග වැලැක්වීම උදෙසා බෙහෙත්, කපජාදු කරන උපකරණ යනාදිය සැපයීම.

12. වියළි කාලපයේ දෙහි දෙඩම් වගාව ව්‍යාප්ත කර එම වගා විශාල වශයෙන් සංකේන්ද්‍රණයවූ ප්‍රදේශයන්හි යූෂ, උකු කළ යූෂ, නිෂ්පාදනය, ජෑම් මධ්‍යසාර, පොතු වලින් ගව ආහාර සකස් කිරීම සඳහා කුඩා පරිමාණයේ කර්මාන්ත ශාලා පිහිටුවීමට කටයුතු කිරීමත් කලමණාය.